ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**ඔක්තෝබර් 2017**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 ඔක්තෝබර් මාසයේ දී 54.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලද අතර, එය 2017 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 4.2 ක අඩුවීමකි. ඒ අනුව, 2017 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන කටයුතු අඩු වේගයකින් වර්ධනය වීමක් පිළිඹිබු වේ. මෙම අඩු වර්ධනය සඳහා, විශේෂයෙන්ම පසුගිය මාසයේ ඉහළ වේගයකින් වර්ධනය වූ නව ඇණවුම් සහ සේවා නියුක්තිකයන්ගේ උප දර්ශක මේ මාසයේදී සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වීම හේතු විය. තවද, 2017 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන සහ ගැනුම් තොග යන උප දර්ශක ද අඩු වේගයකින් වර්ධනය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සඳහා අදාළ වන උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්, විදේශීය සැපයුම්කරුවන්ගේ අමුද්‍රව්‍ය සඳහා අනෙකුත් රටවල් වලින් ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් ඔවුන් ඇණවුම් සැපයීමට වැඩි කාලයක් ගතකිරීම හේතු විය. සමස්තයක් ලෙස සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලද අතර ඒ අනුව, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2017 ඔක්තෝබර් මාසයේදී පසුගිය මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුව ද වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් අගයක් වාර්තා කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ 57.0 ක දර්ශක අගයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී 55.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. 2017 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී සේවා අංශය අඩු වේගයකින් වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. 2017 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වූ අතර නව ව්‍යාපාර සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වර්ධනය විය. එම කාලපරිච්ඡේදයේ දී සේවා නියුක්තිය සහ නිම කිරීමට ඇති කාර්යයන් පහළ යන ලදී. සේවා සැපයීමේ මංපෙත්වල වර්ධනය සහ නව තාක්ෂණික දියුණු කිරීම් හේතුවෙන් ප්‍රධාන වශයෙන් මූල්‍ය සහ සන්නිවේදන අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණි. විශ්‍රාමික සේවකයන් වෙනුවෙන් ඇතිවූ ඇබෑර්තු සඳහා බඳවාගැනීම් සිදු නොකිරීම සහ නවතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි අනියම් සේවකයන් සංඛ්‍යාව අඩුවීම හේතුවෙන් සේවා නියුක්තිය පහළ ගියේය. මෙය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිලිබඳ සමීක්ෂණය ආරම්භ කළ 2015 මැයි මස සිට නිරීක්ෂණය කළ විට සේවා නියුක්තියෙහි දෙවන වරට සිදුවූ පහළ යෑමයි. අය කරන මිල ගණන් සැලකීමේදී එය 2017 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව ඔක්තෝබර් මාසයේ දී අඩු වේගයකින් ඉහළ ගිය අතර නවතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි අය කරන මිල ගණන්වල අඩුවීමක් දක්නට ලැබුණි.. ප්‍රසාද දීමනා සහ උත්සව අත්තිකාරම් වැනි ඍතුමය ප්‍රතිලාභ හේතුවෙන් 2017 ඔක්තෝබර් මාසයේ දී අපේක්ෂිත ශ්‍රම පිරිවැය ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | 2016 | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | 2017 | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | - | - |
| සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 2015 | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | 2016 | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | 2017 | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.